# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2241/41 - 2021 අගෝස්තු මස 19 වැනි බ්‍රහස්පතින්දා - 2021.08.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. - බී. 9/73 (XI)

**(469 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත**

(469 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 71 වන වගන්තිය සමඟ කියවිය යුතු, එකී ආඥාපනතේ 22අ වන වගන්තිය යටතේ වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගාකිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**විමලවීර දිසානායක,**
වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු
ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගාකිරීම
හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍ය.

2021 අගෝස්තු මස 19 වන දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2021 අංක 01 දරන වන සත්ව හා වෘක්ෂලතා (හීලෑ අලින්ගේ ආරක්ෂාව, සුබ සාධනය සහ ලියාපදිංචිය විධිමත් කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

1A - G 34896 — 30 (2021/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## I වන කොටස

### හීලෑ අලින්ගේ ආරක්ෂාව සහ සුබසාධනය සැලසීම

2. අලියකුගේ අයිතිකරු හෝ භාරකාරත්වය දරන සෑම තැනැත්තකුම පහත දැක්වෙන විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු ය:-

(අ) මද කිපීම හෝ වෙනත් යම් හේතුවක් මත අලියකු ඇත්ගොව්වාගේ විධානයන්ට අවනත නොවී ප්‍රචණ්ඩකාරීව සහ අසාමාන්‍ය ලෙස හැසිරෙන අවස්ථාවල එම අලියාට හෝ එම අලියාගෙන් ඇත් ගොව්වාට හෝ වෙනත් තැනැත්තන්ට සිදුවිය හැකි ජීවිත හානි සහ දේපළ හානි වළක්වා ගැනීම සඳහා එම අලියා පාලනය කිරීම සාම්ප්‍රදායික ක්‍රමවේදයන්ට අනුකූලව අවම බලය යොදා ගෙන සාධාරණ පියවර ගනිමින් සිදු කළ යුතු ය. එවැනි අලියකු පාලනය කිරීම සඳහා අනවශ්‍ය පරිදි වේදනාවට සහ පීඩාවට පත් වන ආකාරයෙන් හිතාමතා හෝ අයුක්ති සහගතව යම් හානිකර ඖෂධයක් හෝ ද්‍රව්‍යයක් යොදා ගැනීම නොකළ යුතු අතර, නිර්වින්දන ඖෂධ ලබාදීම අවශ්‍ය වන්නේ නම් එය පශු වෛද්‍යවරයකුගේ උපදෙස් මත පමණක් සිදු කළ යුතු ය;

(ආ) පෙරහැර ඇතුළු සංස්කෘතික කටයුතු සඳහා භාවිත කරනු ලබන වතපුටුව සහිත රන්සිවි ගෙය සහ සධාතුක කරඬුව හෝ දේවාභරණ හැර වෙනත් ආකාරයේ බරක් පටවන අවස්ථාවක, ඒ සඳහා අලියාගේ පිට මත සුදුසු සෑදලයක් ඇතිරීමෙන් තොරව එසේ පැටවීම නොකළ යුතු අතර, අලියකු සංචාරක කර්මාන්තය හෝ එවැනි වෙනත් කාර්ය සඳහා යොදා ගන්නා විට තැනැත්තන් සිව්දෙනෙකුට වඩා වැඩි සංඛ්‍යාවක් එවැනි අලියකුගේ පිට මත රැගෙන යාම නොකළ යුතු ය;

(ඇ) අලියකු යම් වැඩක යෙදවීම සඳහා අයෝග්‍ය තත්වයක සිටින බව පශු වෛද්‍යවරයකු හෝ ලියාපදිංචි පාරම්පරික හස්ති වෛද්‍යවරයකු විසින් නිගමනය කරනු ලබන අවස්ථාවක, එවැනි අලියකු යම් වැඩක හෝ සේවයක හෝ වෙනත් කාර්යයක යෙදවීම නොකළ යුතු ය;

(ඈ) (i) අලියකු ප්‍රවාහනය සඳහා යොදා ගනු ලබන රථය එම අලියාගේ ස්කන්ධයට ගැලපෙන බරක් දරාගත හැකි සහ නියම කරනු ලබන බලපත්‍ර සහිත රථයක් විය යුතු ය. එමෙන්ම එම රථය, අලියා එම රථයට නැංවීම හා ඉන් බිමට බෑම සඳහා ද, ප්‍රවාහනයේ දී මහජනතාවට හෝ යම් දේපළකට හානියක් නොවීම සඳහා ද ශක්තිමත් ආරක්ෂිත ක්‍රමවේදයන්ට අනුව සැකසූ ආවරණයක් සහ ශක්තිමත් තට්ටුවක් සහිත අවම වශයෙන් රෝද හයක් සහිත රථයක් විය යුතු අතර අලි දෙදෙනකු සම්බන්ධයෙන් වන විට අවම වශයෙන් රෝද දහයක් සහිත රථයක් විය යුතු ය;

(ii) කිසිදු අවස්ථාවක අලියකු නොකඩවා පැය දොළහකට වඩා වැඩි කාලයක් ප්‍රවාහනය කිරීම නොකළ යුතු ය. අලියකු ප්‍රවාහනයේ දී අලියකු ප්‍රවාහනය කරන බව සඳහන් පුවරුවක් ප්‍රදර්ශනය කරමින් රථය ධාවනය කළ යුතු අතර, එම රථයේ වේගය පැයට කිලෝමීටර් තිහ (කි.මී. 30) නොඉක්මවිය යුතු ය;

(ඉ) අලියකු මදකිපී සිටින අවස්ථාවක දී හෝ කලබලයට පත් වී සිටින අවස්ථාවක දී බැඳ තැබීමට අවශ්‍ය වුවහොත් හෝ පෙරහැර පැවැත්වෙන අවස්ථාවක මහජන ජීවිත සහ දේපළවල ආරක්ෂාව සඳහා අලියා පාලනය කර ගැනීමට පහසුවන ආකාරයෙන් ආරක්ෂිත බැමි යොදාගෙන පෙරහැර සඳහා යොදවා ගැනීමට අවශ්‍ය වුවහොත්, අලියාට පීඩාවක් නොවන පරිදි එම සතාගේ උස සහ බර මෙන්ම ශක්තියට ද ගැලපෙන ප්‍රමාණයේ සුදුසු දම්වැල් උපයෝගී කරගෙන නියමිත සාම්ප්‍රදායික බැමි ක්‍රමවේදවලට අනුකූලව අලියා බැඳ තැබීම හෝ බැඳගෙන යාම කළ යුතුය. අවම වශයෙන් දින තුනකට වරක් හෝ අලියාගේ එක් පාදයකින් අනෙක් පාදයට දම්වැල මාරු කිරීම කළ යුතු ය;

(ඊ) අලියකු බැඳ තැබීම සඳහා පුරුක් සහිත දම්වැල් යොදා ගනිමින් සාම්ප්‍රදායික ක්‍රමවේදවලට අනුව සකස් කරනු ලබන "බැමි" යොදා ගත යුතු අතර, ඇත්ගොව්වාගේ පාලනයෙන් මිදී කලබලයට පත්ව නිදැල්ලේ සිටින අලියකු පාලනය කර ගැනීමට යොදාගනු ලබන "ටෝරොප්පය" හැර අලියකු බැඳ තැබීමේ කාර්යය සඳහා නයිලෝන් කඹ හෝ උල් හෝ තියුණු දාර සහිත යකඩ දම්වැල් භාවිත කිරීම නොකළ යුතු ය;

(උ) (i) අලියකු ලවා එම අලියාට හෝ වෙනත් අලියකුට අවශ්‍ය ප්‍රමාණයෙන් ආහාර රැගෙන යාම හෝ එම අලියාගේ දම්වැල් සහ සීනු ආදිය අලියාගේ කර මත දමාගෙන යාම හැර, කිසිම අලියකු විවේක ගැනීමකින් තොරව නොකඩවා දිනකට පැය හතරකට වඩා වැඩි කාලයක් යම් රථයක් ඇදගෙන යාම හෝ බරක් ගෙනයෑම සඳහා යොදා ගැනීම නොකළ යුතුය;

(ii) සාම්ප්‍රදායික ක්‍රමවේදය අනුව වෙළුව සහ කර කඹය භාවිත කරමින් අලියෙකුගේ දළ සහ හකු යොදා ගෙන එම අලියාට හෝ වෙනත් අලියකුට අවශ්‍ය ආහාර රැගෙන යාම හා දැව එසවීම හෝ වෙනත් බර එසවීමක් හෝ ඇදීමක් සඳහා යොදා ගැනීම හැර අලියෙකුගේ දළ සහ හකු යොදා සෘජුව දැව හෝ බර ප්‍රවාහනය කිරීම නොකළ යුතුය;

(iii) මෙසේ ඔසවා ගෙන යනු ලබන බර අලියාගේ බර මෙන් 1/3 කට වඩා අඩු විය යුතු ය.

(ඌ) අධික උෂ්ණත්වය සහිත කාලගුණ තත්වයක අලියකුට දීර්ඝ වේලාවක් වැඩ කිරීමට හෝ රැඳී සිටීමට සැලැස්වීම නොකළ යුතු අතර, පෙරහැරකදී හෝ නැවීම සඳහා රැගෙන යන අවස්ථාවක දී හැර අධික උෂ්ණත්වය සහිත කාලගුණයක් පැවතිය හැකි දිවා කාලයක දී දිගු වේලාවක් තාර පාර මත පා ගමනින් රැගෙන යාම නොකළ යුතු ය. පෙරහැරක දී හැර, රාත්‍රී කාලයේ දී අලියකු යම් වැඩක හෝ ක්‍රියාකාරකමක යොදා ගැනීම නොකළ යුතු ය.

(එ) (i) පිරිසිදු හා සෞඛ්‍යාරක්ෂිත පරිසරයක ප්‍රමාණවත් සෙවනක් හා වාතාශ්‍රය සහිත ගාල් කරන මඩුවක් හෝ සාම්ප්‍රදායික හෝ ස්වභාවික අලි පන්තියක් එම අලියා සඳහා සපයා දිය යුතු ය;

(ii) එම ගාල් කරන මඩුවේ වහළයේ උස අලියාගේ උසට ගැලපෙන ආකාරයේ විය යුතු අතර, එහි ඇතුලත උෂ්ණත්වය අවම කිරීම සඳහා වහල ආවරණයට ගෝනි, පිදුරු, පොල්අතු හෝ වෙනත් එවැනි ද්‍රව්‍ය භාවිත කළ යුතු ය;

(iii) වහල ආවරණය සඳහා යකඩ තහඩු හෝ ඇස්බැස්ටස් තහඩු යොදා ගන්නා අවස්ථාවල එම මඩුව තුළ උෂ්ණත්වය අවම කිරීම සඳහා ප්‍රමාණවත් ක්‍රමෝපායයන් අනුගමනය කළ යුතු ය;

(iv) සාම්ප්‍රදායික ස්වභාවික අලි පන්තියක් සකස් කරනු ලබන අවස්ථාවක එය අතු බෙදී ගිය විශාල ශක්තිමත් ගසක සෙවනේ විය යුතු අතර අලියකුගේ පිටුපස පාද තබා ගැනීමට ස්වභාවික ගල් ලැල්ලක් සවි කිරීම හෝ කොන්ක්‍රීට් දමා එම කොටස සකස් කිරීම කළ යුතු ය;

(v) අලියකු රඳවන ස්ථානය ගවයන් ඇතුළු අනෙකුත් ගෘහාශ්‍රිත සතුන්ගෙන් වෙන් කළ යුතු ය;

(vi) අලියා රඳවා ඇති ස්ථානය අකුණුවලට නිරාවරණය වී ඇති ස්ථානයක් නම් එම ස්ථානයේ නිසි පරිදි අකුණු සන්නායක සවි කළ යුතු ය. ගාල් කරන මඩුව හෝ අලි පන්තිය සුදුසු ජලාපවහන ක්‍රමයක් සහ අපද්‍රව්‍ය බැහැර කරලීමේ පද්ධතියක් සහිතව මනා සෞඛ්‍ය ආරක්ෂිත තත්වයේ තබා ගැනීමට සුදුසු පියවර ගත යුතුය.

(ඒ) සාම්ප්‍රදායික පෙරහැර සංස්කෘතික කටයුතු, රාජ්‍ය අනුග්‍රහය හා අනුමතය මත සිදු කරන සංචාරක කටයුතු මෙන්ම රාජ්‍ය උත්සවවල රූපවාහිනි සජීවි විකාශණ හා පටිගත කිරීමේ දී භාවිත කරනු ලබන ගිනි පන්දම්, විදුලි ආලෝක, විදුලි බුබුළු සැරසිලි, සහ ගිනිපන්දම් හැර චිත්‍රපට රූගත කිරීම් හෝ ඒ හා සමාන වෙනත් ක්‍රියාකාරකම් සඳහා අලියකු යොදා ගැනීමේ දී එම අලියාට හානිදායක වන අයුරින් අධික තාපය, විදුලිය, විදුලි පහන් හෝ නිර්වින්දන ඖෂධ ද්‍රව්‍ය යොදා ගැනීම නොකළ යුතු අතර යම් හෙයකින් එසේ කළ යුතු අවස්ථාවක් නම්, පශු වෛද්‍යවරයෙකුගේ හෝ ලියාපදිංචි පාරම්පරික හස්ති වෛද්‍යවරයෙකුගේ උපදෙස්වලට අනුකූලව සිදු කළ යුතු ය.

(ඔ) සාම්ප්‍රදායික පෙරහැර කටයුතුවලදී අත්‍යවශ්‍යයෙන්ම සිදු කළ යුතු සාම්ප්‍රදායික වෙඩිමුර හැර කිසිදු තැනැත්තකු විසින් අලියෙකු ආසන්නයේ රතිඤ්ඤා දැල්වීම හෝ වෙඩි පත්තු කිරීම නොකළ යුතු ය;

(ඕ) උත්සව සඳහා අලි සැරසීමට අවශ්‍ය වන අවස්ථාවලදී ආලෝකමත් කිරීම් සඳහා අලියකුට හානියක් නොවන අවම විදුලි බලයක් සහිත බැටරි පමණක් යොදා ගත යුතු වන අතර, ඒ සඳහා විදුලි ජනක යන්ත්‍ර හෝ වෙනත් කිසිම අනතුරුදායක විදුලි සැපයුම් භාවිත නොකළ යුතු ය;

(ක) සෑම අලියකුටම දිනපතා නැවුම් සහ පෝෂ්‍යදායී ආහාරපාන සහ ජලය ප්‍රමාණවත් ලෙස සැපයීම කළ යුතු අතර, අලියකු පිපාසයෙන් හෝ නිරාහාරව පීඩා විඳීමට සලස්වන ආකාරයෙන් අත්හැර දැමීම නොකළ යුතු ය;

(ග) මද කිපුනු හෝ රෝගී තත්ත්වයෙන් සිටින අලියකු හැර අනෙක් සෑම අලියකු ම ප්‍රවාහනය කරන අවස්ථාවක හෝ පෙරහැර පැවැත්වෙන අවස්ථාවක හැර දිනපතා පැය දෙකහමාරකට (2 ½) නොඅඩු කාලයක් ජලයෙන් නැහැවිය යුතු ය;

(ච) අලියකුට අනතුරුදායක දිය පහරවල් හෝ ගංගාවල් හරහා පිහිනා යාමට සැලැස්වීම නොකළ යුතු ය;

(ජ) අලියකුගේ පෝෂණ ඌනතාවයන් හෝ වෙනත් දුබලතාවයන් ඇත්දැයි යන්න පශු වෛද්‍යවරයකුගෙන් හෝ ලියාපදිංචි පාරම්පරික හස්ති වෛද්‍යවරයකුගෙන් පරීක්ෂා කරවා ගෙන එම වෛද්‍ය නිර්දේශ මත ආහාර හා ඖෂධ ලබා දිය යුතු ය. ඒ සම්බන්ධ සටහන්, ප්‍රතිකාර සටහන් පත්‍රයේ සටහන් කළ යුතු අතර හීලෑ අලියා සඳහා වන බලපත්‍රය වාර්ෂිකව අලුත් කිරීමේදී නියමිත නිලධරයා ලවා පිටසන් කරවා ගත යුතු ය;

(ට) සෑම මාස හයකට වරක්ම පශු වෛද්‍යවරයකු හෝ ලියාපදිංචි පාරම්පරික හස්ති වෛද්‍යවරයකු ලවා අලියා පූර්ණ වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කළ යුතු අතර, ඒ බැව් ප්‍රතිකාර සටහන් පත්‍රයේ සටහන් කළ යුතු ය.

(ඩ) සෑම අලියකුට ම ප්‍රමාණවත් වේලාවක් නිදාගැනීමට ඉඩ සැලසිය යුතු අතර, වයස අවුරුදු පහට (05) අඩු පැටවකු සම්බන්ධයෙන් වන විට එම පැටවාට ඊට වඩා වැඩි කාලයක් නිදා ගැනීමට ඉඩ සැලසිය යුතු ය.

(ණ) අලියකු පුහුණු කිරීම, පාලනය කිරීම හෝ රැකබලා ගැනීම සඳහා පිළිගත් සාම්ප්‍රදායික මෙවලම් වන නියම ප්‍රමිතියෙන් යුක්ත ලේඩියා සමග හෙණ්ඩුව, කෝටුව සහ පිහිය පමණක් භාවිත කළ යුතු අතර, ඒ සඳහා වෙනත් තියුණු ආයුධ, ගින්දර හෝ නිර්වින්දන ඖෂධ යොදා ගැනීම නොකළ යුතුය. මෙම සාම්ප්‍රදායික මෙවලම්වල ප්‍රමිතීන් හා පිරිවිතර I වන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

(ත) පහත සඳහන් අලි, වැඩ හෝ වෙනත් ක්‍රියාකාරකමක නොයෙදවිය යුතු ය:-

(i) ගර්භනී ඇතින්නියක ;

(ii) වයස අවුරුදු දෙකකට වඩා අඩු පැටවකු සිටින ඇතින්නියක ;

(iii) මද කිපුනු අලියකු ;

(iv) වයස අවුරුදු හැට ඉක්මවූ අලියකු ;

එසේ වුව ද, පශු වෛද්‍යවරයකු හෝ ලියාපදිංචි පාරම්පරික හස්ති වෛද්‍යවරයකු විසින් යම් අලියකු පාරම්පරික සංස්කෘතික පෙරහැරක යොදා ගැනීමට සුදුසු තත්ත්වයක සිටින බවට නිර්දේශ කරන්නේ නම් වයස අවුරුදු හැට ඉක්ම වූ අලියකු එවැනි පාරම්පරික සංස්කෘතික පෙරහැරක් සඳහා යොදා ගත හැකි ය; හෝ

(v) රෝගී තත්ත්වයේ සිටින අලියකු;

(ද) (ත) අනුනියෝගයේ නිශ්චිතව සඳහන් අලියකු හැර අනෙකුත් සෑම අලියකු ම දිනපතා කිලෝමීටර පහක (කි.මී. 05) අවම දුර ප්‍රමාණයක්වත් ඇවිදීමට ඉඩ සැලැස්විය යුතු ය;

(න) වයස අවුරුදු පහට වඩා අඩු අලි පැටවකුගේ මව යම් වැඩක යොදවා ඇති අවස්ථාවක එම මව් ඇතින්නිය සමග සිටීමට එම පැටවාට ඉඩදිය යුතු අතර, එම පැටවා වැඩෙහි යෙදවීම, හෝ මව් ඇතින්නියගෙන් වෙන් කිරීම නොකළ යුතු ය;

(ප) අලියකුගේ භාරකරුවකු හෝ රැකබලාගන්නකු සතුව එම අලියා සෞඛ්‍යාරක්ෂිතව රැකබලා ගැනීමට, විවේක ගැනීමට, මද කිපුන විට දී ආරක්ෂිතව බැඳ තැබීමට මෙන්ම මහජන ජීවිත සහ දේපලවලට හානියක් නොවන ලෙසට ආරක්ෂා කර ගැනීමට අක්කර තුනකට වැඩි ඉඩමක් තිබිය යුතු අතර වැඩි වන එක් එක් අලියෙක් සඳහා අමතරව අක්කර එකක් බැගින් වැඩි විය යුතු ය;

(බ) අභිජනන කාර්යයන් සඳහා නිරෝගී සහ ඒ සඳහා සුදුසු අලි යොදා ගත යුතු අතර ඒ සඳහා පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත කමිටුවක් මගින් සුදුසු ක්‍රියාපටිපාටියක් සකස් කළ යුතු අතර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එය ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම කළ යුතු ය:-

(i) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරනු ලබන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධරයකු;

(ii) ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු;

(iii) සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරනු ලබන පශු වෛද්‍යවරයකු;

(iv) දේශීය වෛද්‍ය විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන ලියාපදිංචි පාරම්පරික හස්ති වෛද්‍යවරයකු; සහ

(v) හීලෑ අලි ඇතුන් අයිතිකරුවන්ගේ සංවිධානයේ සභාපති හෝ ලේකම් හෝ භාණ්ඩාගාරික;

(ම) අලියකු රැකබලා ගැනීම සඳහා සුදුසු පුහුණුව ලත් පළපුරුදු ඇත්ගොව්වකු යෙදවිය යුතු අතර, එම තැනැත්තා සේවයේ යෙදෙන අතරතුර දී මධ්‍යසාර හෝ වෙනත් හානිකර මත්ද්‍රව්‍යයක් භාවිත නොකරන බවට එම අලියාගේ අයිතිකරු හෝ භාරකාරත්වය දරන තැනැත්තා විසින් වග බලා ගත යුතු ය. ඇත් ගොව්වකු වශයෙන් සේවය කරන සෑම තැනැත්තකුම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකාවේ හීලෑ අලි ඇතුන් හිමියන්ගේ සංවිධානය ඒකාබද්ධව පවත්වනු ලබන පුහුණු පාඨමාලාව හැදෑරිය යුතු වන අතර, ඒ සඳහා නිකුත් කරනු ලබන සහතිකය අධ්‍යක්ෂ-ජනරාල් වෙත ඉදිරිපත් කොට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන අවසරපත්‍රය සහ හැඳුනුම්පත තමා සන්තකයේ නොමැතිව එම ඇත් ගොව්වා සේවයේ නියුතු නොවිය යුතු ය;

(ය) අලියකුගේ දළයක් හෝ පණු දළයක් කැපීමට අවශ්‍ය වන අවස්ථාවක දී එම අලියාගේ සෞඛ්‍යයට තර්ජනයක් හෝ හානියක් සිදුවීම වැළැක්වීමේ කාර්යයන් සඳහා පශු වෛද්‍යවරයකුගේ හෝ ලියාපදිංචි පාරම්පරික හස්ති වෛද්‍යවරයෙකුගේ පූර්ණ අධීක්ෂණය යටතේ කටයුතු කළ යුතු ය. එසේ කපා එක් මසක් ඇතුළත ඒ බව අධ්‍යක්ෂ-ජනරාල් වෙත දැනුම් දිය යුතු අතර දත්ත සටහන් පත්‍රයේ ඒ සම්බන්ධව අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ විධිමත් සටහනක් තබා හීලෑ අලියා සම්බන්ධයෙන් වන බලපත්‍රය වාර්ෂිකව අලුත් කිරීමේදී ඒ සම්බන්ධව අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පිටසන් තබා ගත යුතු ය;

## II වන කොටස

## හීලෑ අලි ලියාපදිංචිය විධිමත් කිරීම

3. හීලෑ අලියකු ලියාපදිංචි කිරීමට සහ බලපත්‍රයක් ලබා ගැනීමට අදහස් කරන සෑම තැනැත්තකු ම මේ නියෝගවල මේ කොටසේ විධිවිධානවලට යටත්ව නියමිත නිලධරයාගෙන් බලපත්‍රයක් ලබාගත යුතු ය.

4. ආඥාපනතේ 22අ වගන්තියේ කාර්යය සඳහා, අධ්‍යක්ෂ ජනරාල්වරයා අලියා ලියාපදිංචි කිරීම සහ එම අලියා සම්බන්ධයෙන් බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් කරනු ලැබිය යුතු වූ ද, එවැනි අලියකු ලියාපදිංචි කිරීමට සහ එම අලියා වෙනුවෙන් බලපත්‍රයක් නිකුත් කිරීමට බලය ඇත්තා වූ ද නියමිත නිලධරයා (මෙහි මින්මතු "නියමිත නිලධරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) විය යුතු ය.

5. (1) අලියකු පළමුවරට ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය මෙහි II වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව විය යුතු අතර, එහි නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත් විය යුතු ය.

(2)මේ නියෝග ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනට ලියාපදිංචි කර නොමැති නමුත් අයිතිකරුවකු භාරයේ සිටින අලියකු ලියාපදිංචි කිරීම සඳහා වන ඉල්ලුම් පත්‍රය මෙහි III වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව විය යුතු අතර, එම බලපත්‍රය, එහි නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත් විය යුතු ය.

6. (1) 5 වන නියෝගය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලුම් පත්‍රයක් සමඟම -

(අ) බලපත්‍ර ගාස්තුව වන රුපියල් දසදහසක් (රු. 10,000/-) ක මුදලක්, වනජීවී සංරක්ෂණ අරමුදලට ගෙවා ලබාගත් රිසිට්පත;

(ආ) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලබාගත් අලියා සම්බන්ධයෙන් වන ඩී. එන්. ඒ. පරීක්ෂණ වාර්තාව;

(ඇ) ක්ෂුද්‍ර මෘදුකාංගයක් (මයික්‍රෝ චිප්)සවිකරන ලද බවට පශු වෛද්‍යවරයකුගෙන් ලබාගත් සහතිකයක්; සහ

(ඈ) නියමිත නිලධරයා විසින් සපයන ලෙස ඉල්ලා සිටින වෙනත් තොරතුරු,

ඉදිරිපත් කිරීම සිදු කළ යුතු ය.

(2) මේ නියෝග ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට බලපත්‍රයක්, සන්නස් පත්‍රයක් හෝ වෙනත් නීත්‍යානුකූල ලියවිල්ලක් මගින් හෝ පාරම්පරික උරුමයෙන් අලියකුගේ හිමිකාරත්වය දරන යම් තැනැත්තකු, එම අලියා මේ නියෝග යටතේ ලියාපදිංචි කිරීම සිදු කළ යුතු අතර, එම ලියාපදිංචි කිරීම මේ නියෝග ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට මාස තුනක් ඇතුළත සිදු කළ යුතු ය.

(3) (අ) 5 වන නියෝගය යටතේ ඉදිරිපත් කරන ලද සෑම ඉල්ලුම්පත්‍රයක් ම සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා නියමිත නිලධරයා විසින්, 8 වන නියෝගය යටතේ පත් කරනු ලබන පරීක්ෂණ කමිටුවට යොමු කළ යුතු ය.

(ආ) කමිටුව විසින්, එම සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන නිර්ණායක සකස් කොට ලේකම්වරයාගේ අනුමතය සඳහා යොමු කළ යුතු ය.

(ඇ) එම කමිටුව මගින් ලේකම්වරයා විසින් අනුමත කරන ලද නිර්ණායකවලට අනුව, අදාළ ඉල්ලුම්කරුගේ සුදුසුකම් පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව, ඉල්ලුම්පත්‍රය ලැබුනු දින සිට සති දෙකක් ඇතුළත (මෙහි මින්මතු "ලේකම්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) වනජීවී විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාට ඒ සම්බන්ධ වාර්තාවක් ලබා දිය යුතු ය.

(ඈ) එම ඉල්ලුම්පත්‍රය සහ වාර්තාව ලැබීමෙන් සති දෙකක් ඇතුළත ලේකම්වරයා විසින්, 8 වන නියෝගය යටතේ පත් කරනු ලබන නිර්දේශ කමිටුවට අදාළ ඉල්ලුම්පත්‍රය සහ ඊට අදාළ වාර්තාව යොමු කළ යුතු ය.

(ඉ) නිර්දේශ කමිටුව විසින් (ඈ) ඡේදයේ දක්වා ඇති ඉල්ලුම්පත්‍රය සහ වාර්තාව පරීක්ෂා කර බලා, එම වාර්තාව සමඟ වන ඉල්ලුම්පත්‍රය ලැබීමෙන් සති දෙකක් ඇතුළත එම කමිටුවේ නිර්දේශ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවකින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(ඊ) අමාත්‍ය මණ්ඩලය විසින්, නිර්දේශ කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ සලකා බලා බලපත්‍රය නිකුත් කිරීම සඳහා වන අනුමතය නියමිත නිලධරයා වෙත ලබා දිය යුතු ය.

7. (1) නියමිත නිලධරයා විසින් සුදුසුකම් සම්පූර්ණ කරන ලද යම් තැනැත්තකු ලියාපදිංචි කර IV වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූල සහ එහි නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව බලපත්‍රයක් නිකුත් කළ යුතු ය.

(2) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව ඒකාබද්ධව (1) වන අනුනියෝගය යටතේ නිකුත් කරන ලද බලපත්‍රය සමඟ නව තාක්ෂණය භාවිත කරමින් සියලු දත්ත ඇතුළත් කර සකස් කරන ලද කාඩ් පත්‍රයක් ඉල්ලුම්කරුට අලියා භාර දී මාස තුනක් ඉකුත් වීමට පෙරලබා දිය යුතු ය.

(3) යම් බලපත්‍රයක් සඳහා වන ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක, එම ප්‍රතික්ෂේප කිරීමට හේතු නියමිත නිලධරයා විසින් එම තීරණයෙන් දින දාහතරක් ඇතුළත ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම් දිය යුතු ය.

8. (1) පරීක්ෂණ කමිටුව පහත තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය:-

(අ) ලේකම්වරයා විසින් නම් කරනු ලබන කමිටුවේ සභාපතිවරයා විය යුතු, වනජීවී විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු;

(ආ) ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්කරු පදිංචි දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා;

(ඇ) ස්වදේශ කටයුතු විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු;

(ඈ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරනු ලබන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු හෝ පශු වෛද්‍යවරයකු;

(ඉ) ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ-ජනරාල් විසින් නම් කරනු ලබන එම දෙපාර්තමේන්තුවේ පශු වෛද්‍යවරයකු;

(ඊ) බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්-ජනරාල්වරයා විසින් නම් කරනු ලබන බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයකු; සහ

(උ) හීලෑ අලි ඇතුන් අයිතිකරුවන්ගේ සංවිධානයේ සභාපති හෝ ලේකම් හෝ භාණ්ඩාගාරික;

(2) නිර්දේශ කමිටුව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය:-

(අ) ලේකම්වරයා;

(ආ) රාජ්‍ය පරිපාලන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා.

(ඇ) අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(ඈ) බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයා; සහ

(ඉ) ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා;

9. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හීලෑ අලි ඇතුන්ගේ ලේඛනය යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම හෝ යාවත්කාලීන කොට පවත්වාගෙන යාමට සැලැස්වීම කළ යුතු ය.

10. (1) අලියකුගේ හිමිකරුවකුට එරෙහිව කරනු ලබන සෑම පැමිණිල්ලක් ම 8 වන වගන්තිය යටතේ පත් කරනු ලබන පරීක්ෂණ කමිටුව විසින් විභාග කළ යුතු ය.

(2) පරීක්ෂණ කමිටුව විසින් පැමිණිල්ල ලැබී සති දෙකක් ඇතුළත පැමිණිල්ල සම්බන්ධයෙන් ස්වකීය පරීක්ෂණය අවසන් කර ඒ පිළිබඳ ස්වකීය නිරීක්ෂණ ද සමග එම පැමිණිල්ල 8 වන වගන්තිය යටතේ පත් කරන ලද නිර්දේශ කමිටුව වෙත යොමු කළ යුතු ය.

(3) අලියාගේ හිමිකරු මේ නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරමින් ක්‍රියාකර ඇති බව නිර්දේශ කමිටුව සෑහීමකට පත්වන පරිදි පෙනී යන්නේ නම්, එම කමිටුව විසින් එම අලියාව එම අයිතිකරුගේ භාරයෙන් ඉවත් කරන ලෙස නිර්දේශ ලබා දිය යුතු ය.

(4) නව අයිතිකරුවකුට භාරදෙන තෙක් ඒ අලියා, ලේකම්වරයා විසින් ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ භාරකාරත්වයට පත් කළ යුතු ය.

එසේ වුව ද, අලියාගේ මුල් හිමිකරු මේ නියෝගවල විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇති බව නිර්දේශ කමිටුව සෑහීමට පත්වන පරිදි පෙනී යන්නේ නම් පමණක් ඒ අලියා මුල් හිමිකරුට භාරදිය හැකි ය.

(5) (4) වන අනු නියෝගය යටතේ ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට භාර දෙන ලද අලියකු නඩත්තු කිරීම සඳහා දරනු ලබන සියලු වියදම්, වනජීවී සංරක්ෂණ අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු ය.

11. (1) මේ නියෝග යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් අන් සතු කළ නොහැක. එවැනි බලපත්‍රයක් අස්ථානගත වුවහොත් හෝ සොරකම් කරන ලදහොත් අයිතිකරු විසින් වහාම එය නියමිත නිලධරයාට හෝ අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම්වරයාට හා අලියා සාමාන්‍යයෙන් රඳවා තබනු ලබන ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාට දැනුම් දිය යුතු ය.

(2) සෑම බලපත්‍රයක් ම එය නිකුත් කරනු ලැබූ දින සිට වර්ෂ එකක කාලයක් සඳහා වලංගු විය යුතු ය.

(3) බලපත්‍රයක් ලබාගෙන ඇත්තේ යම් අලියකු සම්බන්ධයෙන් ද, එම අලියා විකුණා ඇත්නම්, මිය ගොස් ඇත්නම් හෝ වෙනත් යම් ආකාරයකින් බැහැර කොට ඇත්නම් මිස, එම බලපත්‍රය ඉකුත්වීමේ දිනයට මාස එකකට පෙරාතුව බලපත්‍රය අලුත් කර ගැනීම සඳහා ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කළ යුතු ය.

(4) (අ) අලියකු සම්බන්ධයෙන් වාර්ෂික බලපත්‍රය අලුත් කිරීම සඳහා වූ ඉල්ලුම්පත්‍රය V වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව විය යුතු අතර එහි අඩංගු කොන්දේසිවලට යටත් විය යුතුය. බලපත්‍රය අලුත් කිරීම සඳහා ගාස්තුව රුපියල් පන් දහසක් (රු.5000/=) විය යුතු ය.

(ආ) බලපත්‍රය අලුත්කිරීම සඳහා ප්‍රමාද වන සෑම මාසයක් සඳහා ම බලපත්‍ර ගාස්තුවට අමතරව රුපියල් පන්සියයක (500/=) මුදලක් ගෙවිය යුතු අතර, එම බලපත්‍රය වර්ෂයකට වඩා වැඩි කාලයක් අලුත් කරනු නොලැබුවහොත් නියමිත බලධරයා විසින් එම බලපත්‍රය අවලංගු කළ යුතු ය.

(ඇ) එසේ අවලංගු කරනු ලැබූ බලපත්‍රය දරන තැනැත්තා නැවත බලපත්‍රයක් සඳහා අයදුම් කරනු ලබන්නේ නම් එය 5 වන නියෝගය යටතේ සිදු කළ යුතු ය.

(5) බලපත්‍රයක් නිකුත් කරනු ලැබුවේ යම් කොන්දේසිවලට යටත්ව ද ඒ කොන්දේසි උල්ලංඝනය කරනු ලැබුවහොත්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, ඒ බලපත්‍රය අත්හිටුවීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.

12. හීලෑ අලියකු මිය ගිය හෝ නැතිවූ හෝ අයිතිකරුගේ භාරයෙන් පැනගිය අවස්ථාවක. එම අලියා අයිතිව සිටි හෝ සන්තකව සිටි තැනැත්තා විසින් ඒ පිළිබඳව නියමිත නිලධරයා වෙත හෝ අදාළ ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපතිවරයා වෙත වහාම දැනුම් දිය යුතුය. නැති වූ හෝ පැන ගිය අලියා සොයා ගනු ලැබූ හෝ අල්ලා ගනු ලැබූ අවස්ථාවක, එම අලියා සොයා ගත් හෝ අල්ලා ගත් තැනැත්තා විසින් ඒ පිළිබඳව ආසන්නතම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත වහාම දැනුම් දිය යුතු අතර ප්‍රාදේශීය ලේකම් විසින් ඒ බව නියමිත නිලධරයා හා අදාළ ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපතිවරයා වෙත දැනුම් දිය යුතු ය.

13. (1) මේ නියෝග යටතේ ලබාගත් බලපත්‍රයක් අවලංගු කරනු ලැබූ විට, ඒ අලියාගේ අයිතිකරු වීමට අපේක්ෂා කරන යම් තැනැත්තකු විසින්, මෙහි II වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව අයදුම්පත්‍රයක්, බලපත්‍රයක් ලබා ගැනීම සඳහා මේ නියෝගවල විධිවිධානවලට යටත්ව ඉදිරිපත් කළ යුතු ය.

(2) (1) වන අනු නියෝගයේ සඳහන් ඉල්ලුම්කරු අලියාගේ නව අයිතිකරු වීමට සුදුසු බව නියමිත නිලධරයාගේ මතය වන්නේ නම්, ඔහු විසින් එම ඉල්ලුම්කරුට නව බලපත්‍රයක් නිකුත් කළ යුතු අතර, අලියා පිළිබඳ සියලු දත්ත ඇතුළත්, 7(2)නියෝග යේ සඳහන් පරිදි නවීන තාක්ෂණය යොදාගෙන සකස් කළ කාඩ්පතක් ඔහුට නිකුත් කළ යුතු ය.

14. මේ නියෝග යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක, යම් ව්‍යාජ තොරතුරු සපයන සෑම තැනැත්තකුම ආඥාපනත යටතේ වරදක් සිදු කරනු ලැබේ.

15. මෙම නියෝග යටතේ ලියාපදිංචි කිරීමේ සහ බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු ලෙස ලැබෙන සියලු මුදල් ප්‍රමාණයන් වනජීවී සංරක්ෂණ අරමුදල වෙත බැර කරනු ලැබිය යුතු ය.

16. අලියකුගේ අයිතිකරු හෝ භාරකාරත්වය දරන සෑම තැනැත්තකුම අලියකු සම්බන්ධයෙන් මෙහි VI වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතිය අනුව පහත සඳහන් වාර්තාවන් ඇතුළත් කර දත්ත වාර්තා පොතක් පවත්වාගෙන යා යුතු අතර පරීක්ෂා කිරීම සඳහා එකී වාර්තා සෑම මාස හයකට වරක්ම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ බලයලත් නිලධරයෙකු හමුවේ කැඳවන අවස්ථාවක ඉදිරිපත් කළ යුතුය. පහත සඳහන් වාර්තා ඇතුළත් මෙම දත්ත වාර්තා පොත නිකුත් කිරීමේ අධිකාරිය සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සතු වේ:-

(අ) දත්ත සටහන් පත්‍රය
(ආ) ප්‍රතිකාර සටහන් පත්‍රය
(ඇ) එන්නත් සටහන් පත්‍රය

## III වන කොටස

### ඓතිහාසික සංස්කෘතික පෙරහැර සඳහා හීලෑ අලි ලබා ගැනීම

17. (1) යම් ඓතිහාසික සංස්කෘතික පෙරහැරක් සංවිධානය කරනු ලබන යම් විහාරස්ථානයක් හෝ දේවාලයක් සඳහා හීලෑ අලි ලබා ගැනීමට අවශ්‍ය වන්නේ නම්, අවස්ථාවෝචිත පරිදි එම විහාරස්ථානයේ හෝ දේවාලයේ විහාරාධිපති හෝ භාරකරු විසින් ඒ සඳහා හීලෑ අලි ඇතුන් අයිතිකරුවන්ගේ සංවිධානය වෙත VII වන උපලේඛනයට සාරානුකූලව ඉල්ලුම්පත්‍රයක් යොමු කළයුතු අතර, එම සංවිධානය විසින් එකී ඉල්ලුම්පත්‍රය පිටසන් කොට බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්-ජනරාල්වරයා වෙත යොමු කළ යුතු ය.

(2) එම ඉල්ලුම්පත්‍රය බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්-ජනරාල්වරයා විසින් නිර්දේශ කරනු ලැබ බුද්ධශාසන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කළ යුතු ය.

(3) එම අනුමතයෙන් පසු බුද්ධශාසන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් විසින් එම අනුමතය ලේකම්වරයා වෙත ලැබුණු පසු ලේකම්වරයා වෙත යැවිය යුතු ය. ඉන්පසු ලේකම්වරයා විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා භාරයේ සිටින හීලෑ අලියකු ඒ කාර්යය සඳහා විධිමත්ව නිදහස් කරන ලෙස විධානයක් කරනු ලැබිය යුතු ය.

(4) එසේ නිදහස් කරනු ලබන සෑම අලියකු සම්බන්ධව ම විස්තර ඇතුළත් සවිස්තරාත්මක ලේඛනයක්, අවස්ථාවෝචිත පරිදි අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සකස්කර යාවත්කාලීන කර පවත්වාගෙන යා යුතු ය.

(5) මේ නියෝගය යටතේ යම් හීලෑ අලියෙකු ලබා ගන්නා සෑම ඉල්ලුම්කරුවකු ම විසින් මෙම නියෝගවල නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

18. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත්, මේ නියෝගවල -

"අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නට (469 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ ඒ යෙදුම සඳහා ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය.

"අලියා" යන්නට (469 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ ඒ යෙදුම සඳහා ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය.

"ආඥාපනත" යන්නෙන් (469 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත අදහස් වේ;

"අලියකුගේ අයිතිකරු" යන්නට අලියෙකු මිලදී ගෙන සන්තකයටම ගත් තැනැත්තා යන්න අදහස් වේ.

"අලියකුගේ භාරකාරත්වය දරන තැනැත්තා" යන්නට අලියෙකු රැකබලා ගැනීම සඳහා පමණක් නෛතික හිමිකාරිත්වයක් ඇති තැනැත්තා යන්න අදහස් වේ.

"භාරකරු" යන්නට, (318 වන අධිකාරය වූ) බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනතේ ඒ යෙදුම සඳහා ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය.

"පශු වෛද්‍යවරයා" යන්නට 1956 අංක 46 දරන පශු වෛද්‍ය සහ පශු වෛද්‍ය වෘත්තික පනත යටතේ ලියාපදිංචි වී ඇති පශු වෛද්‍යවරයෙකු අදහස් වේ.

"විහාරාධිපති" යන්නට, (318 වන අධිකාරය වූ) බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනතේ ඒ යෙදුම සඳහා ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය.

"වනජීවී සංරක්ෂණ අරමුදල" යනු ආඥාපනතේ 65 වන වගන්තිය යටතේ පිහිටුවන ලද වනජීවී සංරක්ෂණ අරමුදල වේ.


19. අංක 662/4 දරන 1991 මැයි මස 14 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1991 දළ ඇතුන් හා ඇතුන් ලියාපදිංචි කිරීමේ සහ ඔවුන් සඳහා බලපත්‍ර දීමේ නියෝග, ඒ නියෝග යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

**I** *වන උපලේඛනය* **[**2(ණ) නියෝගය**]**

**ඇත්ගොව්වන් විසින් භාවිත කරනු ලබන සාම්ප්‍රදායික මෙවලම්වල ප්‍රමිතීන් හා පිරිවිතර**


***"හෙන්ඩුව" සම්බන්ධ ප්‍රමිතීන් හා පිරිවිතරයන්***

**<u>හෙන්ඩුව</u>**




*"පිහිය" සම්බන්ධ ප්‍රමිතීන් හා පිරිවිතර*

## පිහිය



*"කෙව්ට" සම්බන්ධ ප්‍රමිතීන් හා පිරිවිතර*

## කෙව්ට



*II වන උපලේඛනය* [5(1) නියෝගය]

**හීලෑ අලියකු ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍ර ආකෘතිය**

1. ඉල්ලුම්කරුගේ විස්තර

(i) ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :

(ii) ඉල්ලුම්කරුගේ මුලකුරු සමඟ නම :

(iii) ලිපිනය :

(iv) ජා.හැ.ප. අංකය :

(v) දුරකථන අංකය : ජංගම: ස්ථාවර:

(vi) විද්‍යුත් තැපැල් :

2. ඉල්ලුම්කරනු ලබන අලි පිළිබඳ විස්තර

(i) අලියා රඳවා තබන ස්ථානයේ ලිපිනය

(අ) පළාත :

(ආ) දිස්ත්‍රික්කය :

(ඇ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :

(ඈ) ග්‍රාම නිලධාරී කොට්ඨාශය :

(ii) ඉල්ලුම්කරනු ලබන්නේ අලියකු ද/ඇතකු ද/ඇතින්නියක් ද යන්න ඃ

(iii) ඉල්ලුම්කරනු ලබන අලියාගේ වයස ඃ

(iv) අලියා ලබා ගන්නා විහාරස්ථානය අයත් වන නිකාය ඃ

(v) අලියා ඉල්ලුම් කරන විහාරස්ථානයේ / දේවාලයේ / වෙනත් බාහිර පුද්ගලික අයවලුන් වාර්ෂිකව සිදු කරනු ලබන පෙරහැර සහ සංස්කෘතික කාර්යයන් පිළිබඳ සවිස්තර වාර්තාවක් (බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයා විසින් සනාථ කර තිබිය යුතුයි): ----------------------------------------

(vi) ඉල්ලුම්කරු සතුව වෙනත් අලි සිටියේ ද / සිටී ද ?

(අ) ඔව් නම් අලි සංඛ්‍යාව :

(ආ) එම අලි ලියාපදිංචි අංකය පිළිබඳ විස්තර :

(ඇ) එම අලි යොදා ගන්නා පෙරහැර සහ සංස්කෘතික කටයුතු පිළිබඳ විස්තර :

(ඈ) එම අලි ඉල්ලුම්කරුට ලැබී ඇති ආකාරය :

(ඉ) සන්තකයේ සිටි එවැනි අලියකු මරණයට පත් වීමක් සිදු වී ඇත්නම් එම මරණය ස්වභාවික මරණයක්ද නොඑසේ නම් වෙනත් කරුණක්ද යන්න පිළිබඳ විස්තර :

(ඊ) සන්තකයේ සිටි එවැනි අලි වෙනත් පාර්ශවයකට පැවරීමක් කර ඇත්නම් පැවරීමට හේතු :

3. ඉල්ලුම්කරුගේ ශක්‍යතාවය පිළිබඳ තොරතුරු

i. අලියා රැකබලා ගැනීම සඳහා ඉල්ලුම්කරුගේ ආර්ථික හැකියාව පිළිබඳ විස්තර (බැංකු වාර්තා, දේපල / ඉඩකඩම් ඇතුළු සියලු ආදායම් උත්පාදන පිළිබඳ විස්තර සහ ඊට අදාළව ආසන්නම වසර 3ක වාර්තාවල සහතික කරන ලද පිටපත්) :

ii. අලියාට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය ලබා ගන්නා ආකාරය පිළිබඳ විස්තර :

iii. අලියාට අවශ්‍ය ජල පහසුකම් (බීමට සහ නෑමට) ලබා ගන්නා ආකාරය පිළිබඳ විස්තර :

iv. මද කිපෙන කාලයට රඳවා තබා ගන්නා ආකාරය :

v. අවශ්‍ය ප්‍රතිකාර ලබා ගන්නා ආකාරය :

vi. අලියා සඳහා ප්‍රවාහන පහසුකම් ලබා ගන්නා ආකාරය :

4. ඇත්ගොව්වන් පිළිබඳ විස්තර

i. ඇත්ගොව්වාගේ මුලකුරු සමඟ නම :

ii. ලිපිනය :

iii. ජා.හැ.ප. අංකය :

iv. පළපුරුද්ද :

v. ලබා ඇති සම්මාන/සහතික ආදිය :

vi. වෛද්‍ය සහතිකපත් ආදිය :

5. තාක්ෂණික අවශ්‍යතා

i. අලියා සම්බන්ධයෙන් සිදුකළ DNA පරීක්ෂණ වාර්තාවේ විස්තරඃ

ii. ක්ෂුද්‍ර මෘදුකාංග අංකයඃ

(ඒ පිළිබඳ පශු වෛද්‍යවරයෙකුගෙන් ලබාගත් සහතිකය ඇමිණිය යුතුයි)

6. ලියාපදිංචි කිරීමේ ගාස්තුව ගෙවූ රිසිට් පත්‍රයේ අංකයඃ

7. ඉහත සඳහන් සියලුම කරුණු සත්‍ය හා නිවැරදි බවත් අලියකු ලබා ගැනීම සඳහා මා තෝරා ගනු ලැබුවහොත් එම අලියාගේ සුබසාධනය සහ රැකවරණය තහවුරු වන පරිදි ගිවිසුම් ප්‍රකාරව අලියා රැකබලා ගැනීමට හැකියාවක් පවතින බවත් මින් ප්‍රකාශ කරමි.

.................................... ..........................................................

දිනය ඉල්ලුම්කරුගේ අත්සන

8. වෙනත් නිර්දේශ

i. හීලෑ අලි ඇතුන් අයිතිකරුවන්ගේ සංවිධානයේ නිර්දේශ :

අලියකු රැකබලා ගැනීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට නිර්දේශ කරමි/නොකරමි.

....................................................

හීලෑ අලි ඇතුන් අයිතිකරුවන්ගේ
සංවිධානයේ සභාපතිගේ/ ලේකම්වරයාගේ අත්සන
(නිල මුද්‍රාව)

ii. බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ/බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයාගේ නිර්දේශ :

අලියෙකු රැකබලා ගැනීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට නිර්දේශ කරමි/නොකරමි.

..............................................................................

බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ/
බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයාගේ අත්සන
(නිල මුද්‍රාව)

**III** වන උපලේඛනය [5(2) නියෝගය]

**වර්තමානයේ අයිතිකරුවකු භාරයේ සිටින දැනට ලියාපදිංචි කර නොමැති අලියකු ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය**

1. ඉල්ලුම්කරුගේ විස්තර

   i. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :
   ii. ඉල්ලුම්කරුගේ මුලකුරු සමග නම :
   iii. ලිපිනය :
   iv. ජා.හැ.ප. අංකය :
   v. දුරකථන අංකය : ජංගම ස්ථාවර
   vi. විද්‍යුත් තැපැල් :

2. ඉල්ලුම්කරනු ලබන හස්තීන් පිළිබඳ විස්තර

   i. අලියා රඳවා තබන ස්ථානයේ ලිපිනය :
      (අ) පළාත :
      (ආ) දිස්ත්‍රික්කය :
      (ඇ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :
      (ඈ) ග්‍රාම නිලධාරී කොට්ඨාශය :
   ii. අලියාගේ ස්වභාවය (දළ සහිත/රහිත භාවය) :
   iii. දළ සහිත නම් දළයේ දිග : වම් දළය : අඩි ................ අඟල්................
   දකුණු දළය : අඩි ..............අඟල්.................
   iv. උරහිස දක්වා උස : අඩි ................ අඟල් ................
   v. පිරිමි සතෙකු ද, ගැහැණු සතෙකු ද යන වග:
   vi. වයස:
   vii. ඉදිරිපාදයේ වට ප්‍රමාණය : අඟල්................
   viii. මිනුම් ලබා ගත් දිනය :
   ix. හඳුනා ගැනීමේ ස්ථිර සලකුණු : (සමේ පැහැය වෙනස්වීම සහ බැඳ තැබීම නිසා පෙර හා පසු පාදවල ඇති වූ කැලැල් යනාදිය ඇතුලුව)
   x. වෙනත් යම් කැපී පෙනෙන ලක්ෂණ හෝ අංග විකෘතිවීම් :
   xi. ඡායාරූප

අලියාගේ පැති දර්ශනය (වම) (3"x4")

අලියාගේ පැති දර්ශනය (දකුණ) (3"x4")

අලියාගේ ඔළුව සහ හොඬවැල සහිත ඉදිරිපස දර්ශනය (3"x4")

වලිගය සමඟ අලියාගේ පිටුපස දර්ශනය (3"x4")

xii. අලිහිමිකරුට අලියා අත්පත් කරගත්/ලැබුණු ආකාරය :

xiii. මිලදී ගත්තේනම් මිල සහ කවරකුගෙන්ද යන වග :

xiv. විහාරස්ථානයක් නම්, විහාරස්ථානය අයත් වන නිකාය :

xv. විහාරස්ථානයේ / දේවාලයේ / වෙනත් බාහිර පුද්ගලික අයවලුන් වාර්ෂිකව සිදු කරනු ලබන පෙරහැර සහ සංස්කෘතික කාර්යයන් පිළිබඳ සවිස්තර වාර්තාව (බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයා විසින් සනාථ කර තිබිය යුතුයි): ............................

xvi. ඉල්ලුම්කරු සතුව වෙනත් අලීන් සිටී ද ?

(අ) අලි සිටී නම් සංඛ්‍යාව :

(ආ) එම අලි ලියාපදිංචි අංකය පිළිබඳ විස්තර :

(ඇ) එම අලි යොදා ගන්නා පෙරහැර සහ සංස්කෘතික කාර්යයන් පිළිබඳ විස්තර :

(ඈ) එම අලින් ඉල්ලුම්කරුට ලැබී ඇති ආකාරය :

(ඉ) සන්තකයේ සිටි එවැනි අලි මරණයට පත් වීමක් සිදු වී ඇත්නම් එම මරණය ස්වභාවික මරණයක්ද නොඑසේ නම් වෙනත් කරුණක්ද යන්න පිළිබඳ විස්තර:

(ඊ) සන්තකයේ සිටි එවැනි අලි වෙනත් පාර්ශවයකට පැවරීමක් කර ඇත්නම් පැවරීමට හේතු:

3. ඉල්ලුම්කරුගේ ශක්‍යතාවය පිළිබඳ තොරතුරු

i. අලියා රැකබලා ගැනීම සඳහා ඉල්ලුම්කරුගේ ආර්ථික හැකියාව පිළිබඳ විස්තර :
(බැංකු වාර්තා, දේපල / ඉඩකඩම් ඇතුළු සියලු ආදායම් උත්පාදන පිළිබඳ විස්තර සහ ඊට අදාළව ආසන්නම වසර 3ක වාර්තාවල සහතික කරන ලද පිටපත්

ii. අලියාට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය ලබා ගන්නා ආකාරය පිළිබඳ විස්තර :

iii. අලියාට අවශ්‍ය ජල පහසුකම් (බීමට සහ නෑමට) ලබා ගන්නා ආකාරය පිළිබඳ විස්තර :

iv. මද කිපෙන කාලයට රඳවා තබා ගන්නා ආකාරය :

v. අවශ්‍ය ප්‍රතිකාර ලබා ගන්නා ආකාරය :

vi. අලියා සඳහා ප්‍රවාහන පහසුකම් ලබා ගන්නා ආකාරය :

4. ඇත්ගොව්වන් පිළිබඳ විස්තර

i. ඇත්ගොව්වාගේ මුලකුරු සමඟ නම :

ii. ලිපිනය :

iii. ජා.හැ.ප. අංකය :

iv. පළපුරුද්ද :

v. ලබා ඇති සම්මාන/සහතික ආදිය :

vi. වෛද්‍ය සහතිකපත් ආදිය :

5. අලියා සම්බන්ධයෙන් සිදුකළ DNA පරීක්ෂණ වාර්තාවේ විස්තරඃ

6. ක්ෂුද්‍ර මෘදුකාංග අංකයඃ
(ඒ පිළිබඳ පශු වෛද්‍යවරයෙකුගෙන් ලබාගත් සහතිකය ඇමිණිය යුතුයි)

7. ලියාපදිංචි කිරීමේ ගාස්තුව ගෙවූ රිසිට් පත්‍රයේ අංකය :

8. ඉහත සඳහන් සියලුම කරුණු සත්‍ය හා නිවැරදි බවත් අලියෙකු ලබා ගැනීම සඳහා මා තෝරා ගනු ලැබුවහොත් අලියාගේ සුබසාධනය සහ රැකවරණය තහවුරු වන පරිදි ගිවිසුම් ප්‍රකාරව අලියා රැකබලා ගැනීමට හැකියාවක් පවතින බවත් මින් ප්‍රකාශ කරමි.

| | |
|---|---|
| ................................ | ................................................... |
| දිනය | ඉල්ලුම්කරුගේ අත්සන |

9. වෙනත් නිර්දේශ

i. හීලෑ අලි ඇතුන් අයිතිකරුවන්ගේ සංවිධානයේ නිර්දේශ :

අලියකු රැකබලා ගැනීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට නිර්දේශ කරමි/නොකරමි.

...................................................
හීලෑ අලි ඇතුන් අයිතිකරුවන්ගේ
සංවිධානයේ සභාපතිගේ/ ලේකම්වරයාගේ අත්සන
(නිල මුද්‍රාව)

ii. බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ/බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයාගේ නිර්දේශ :

අලියෙකු රැකබලා ගැනීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට නිර්දේශ කරමි/නොකරමි.

...........................................................................
බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ/
බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයාගේ අත්සන
(නිල මුද්‍රාව)

**IV** වන උපලේඛනය **[**7(1) නියෝගය**]**

**හීලෑ අලියෙකු ලියාපදිංචි කොට රඳවා තබා ගැනීම සඳහා වන බලපත්‍ර ආකෘතිය**

1. ඡායාරූප

**ඡායාරූප**

අලියාගේ පැති දර්ශනය (වම)
(3"x4")

**ඡායාරූප**

අලියාගේ පැති දර්ශනය (දකුණ)
(3"x4")

**ඡායාරූප**

අලියාගේ ඔළුව සහ හොඬවැල සහිත ඉදිරිපස දර්ශනය
(3"x4")

**ඡායාරූප**

වලිගය සමග අලියාගේ පිටුපස දර්ශනය
(3"x4")

2. අලියාගේ නම (ඇත්නම්) :

3. ලියාපදිංචි අංකය :

4. අයිතිකරුගේ විස්තර :

(i) අයිතිකරුගේ සම්පූර්ණ නම :
(ii) අයිතිකරුගේ මුලකුරු සමඟ නම :
(iii) ලිපිනය :
(iv) ජා.හැ.ප. අංකය :
(v) දුරකථන අංකය : ජංගම ස්ථාවර
(vi) විද්‍යුත් තැපැල් :

5. භාරකරුගේ විස්තර :

(i) භාරකරුගේ සම්පූර්ණ නම :
(ii) භාරකරුගේ මුලකුරු සමඟ නම :
(iii) ලිපිනය :
(iv) ජා.හැ.ප. අංකය :
(v) දුරකථන අංකය : ජංගම ස්ථාවර
(vi) විද්‍යුත් තැපැල් :

6. අලියාගේ ස්වභාවය (දළ සහිත/රහිත භාවය) :

7. දළ සහිත නම් දළයේ දිග : වම් දළය : අඩි ................ අඟල්.................

දකුණු දළය : අඩි ............. අඟල්.................

8. උරහිස දක්වා උස ඃ අඩි ................ අඟල් ................

9. පිරිමි සතෙකු ද, ගැහැණු සතෙකු ද යන වගඃ

10. ලියාපදිංචි කළ දිනට වයසඃ

11. ඉදිරිපාදයේ වට ප්‍රමාණය ඃ අඟල්................

12. මිනුම් ලබා ගත් දිනය ඃ

13. හඳුනා ගැනීමේ ස්ථිර සලකුණු ඃ (සමේ පැහැය වෙනස්වීම සහ බැඳ තැබීම නිසා පෙර හා පසු පාදවල ඇති වූ කැලැල් යනාදිය ඇතුලුව)

14. වෙනත් යම් කැපී පෙනෙන ලක්ෂණ හෝ අංග විකෘතිවීම් ඃ

15. අලියා රඳවා තබන ස්ථානයේ ලිපිනය හා පරිපාලන දිස්ත්‍රික්කය ඃ

16. ක්ෂුද්‍ර මෘදුකාංග අංකය ඃ

17. දත්ත කාඩ්පත් අංකය ඃ

................................ ..................................................................

දිනය — බලපත්‍ර නිකුත් කිරීමේ නිලධාරියාගේ අත්සන (නිල මුද්‍රාව)

**V** වන උපලේඛනය [11(4) නියෝගය]

**වාර්ෂික බලපත්‍රය අලුත් කිරීම සඳහා වූ ඉල්ලුම්පත්‍රය**

1. ඡායාරූප

| | |
|---|---|
| **ඡායාරූප** | **ඡායාරූප** |
| අලියාගේ පැති දර්ශනය (වම) (3"x4") | අලියාගේ පැති දර්ශනය (දකුණ) (3"x4") |
| **ඡායාරූප** | **ඡායාරූප** |
| අලියාගේ ඔළුව සහ හොඬවැල සහිත ඉදිරිපස දර්ශනය (3"x4") | වලිගය සමඟ අලියාගේ පිටුපස දර්ශනය (3"x4") |

2. ලියාපදිංචි කළ දිනය සහ අංකය :

3. අලියාගේ නම :

4. අයිතිකරුගේ විස්තර :

i. අයිතිකරුගේ සම්පූර්ණ නම :
ii. අයිතිකරුගේ මුලකුරු සමඟ නම :
iii. ලිපිනය :
iv. ජා.හැ.ප. අංකය :
v. දුරකථන අංකය : ජංගම ස්ථාවර
vi. විද්‍යුත් තැපැල් :

5. භාරකරුගේ විස්තර :

(i) භාරකරුගේ සම්පූර්ණ නම :
(ii) භාරකරුගේ මුලකුරු සමඟ නම :
(iii) ලිපිනය :
(iv) ජා.හැ.ප. අංකය :
(v) දුරකථන අංකය : ජංගම ස්ථාවර
(vi) විද්‍යුත් තැපැල් :

6. අලියාගේ ස්වභාවය (දළ සහිත/රහිත භාවය) :

7. දළ සහිත නම් දළයේ දිග : වම් දළය : අඩි ............... අඟල්................
දකුණු දළය : අඩි ............. අඟල්................

8. උරහිස දක්වා උස : අඩි ............... අඟල් ...............

9. පිරිමි සතෙකු ද, ගැහැණු සතෙකු ද යන වග:

10. පළමුවරට ලියාපදිංචි කළ දිනට වයසඃ

11. ඉදිරිපාදයේ වට ප්‍රමාණය : අඟල්...............

12. මිනුම් ලබා ගත් දිනය :

13. හඳුනා ගැනීමේ ස්ථිර සලකුණු : (සමේ පැහැය වෙනස්වීම සහ බැඳ තැබීම නිසා පෙර හා පසු පාදවල ඇති වූ කැලැල් යනාදිය ඇතුලුව)

14. වෙනත් යම් කැපී පෙනෙන ලක්ෂණ හෝ අංග විකෘතිවීම් :

15. අලියා රඳවා තබන ස්ථානයේ ලිපිනය හා පරිපාලන දිස්ත්‍රික්කය :

16. ක්ෂුද්‍ර මෘදුකාංග අංකය :

17. දත්ත කාඩ්පත් අංකය :

18. වාර්ෂික බලපත්‍රය අලුත් කිරීමේ ගාස්තුව ගෙවූ රිසිට් පත් අංකයඃ

19. වෙනත් :

| | |
|---|---|
| ............................... | ................................................................ |
| දිනය | ඉල්ලුම්කරුගේ අත්සන |

**VI** වන උපලේඛනය [16 නියෝගය]

**දත්ත වාර්තා පොත**

අ. දත්ත සටහන් පත්‍රය

1.ඡායාරූප

ඡායාරූප

අලියාගේ පැති දර්ශනය (වම)
(3"x4")

ඡායාරූප

අලියාගේ පැති දර්ශනය (දකුණ)
(3"x4")

ඡායාරූප

අලියාගේ ඔළුව සහ හොඬවැල සහිත ඉදිරිපස දර්ශනය
(3"x4")

ඡායාරූප

වලිගය සමඟ අලියාගේ පිටුපස දර්ශනය
(3"x4")

2. අයිතිකරුගේ විස්තර :

(i) අයිතිකරුගේ නම :
(ii) ලිපිනය :
(iii) ජා.හැ.ප. අංකය :
(iv) දුරකථන අංකය : ජංගම ස්ථාවර
(v) විද්‍යුත් තැපැල් :
(vi) අලියා අයිතිකරුට හිමිකරුට අලියා අත්පත් කරගත්/ ලැබුණු ආකාරය:
(vii) මිලදී ගත්තේ නම් මිල සහ කවරකුගෙන්ද යන වග:

3. භාරකරුගේ විස්තර :

(i) භාරකරුගේ සම්පූර්ණ නම :
(ii) භාරකරුගේ මුලකුරු සමඟ නම :
(iii) ලිපිනය :
(iv) ජා.හැ.ප. අංකය :
(v) දුරකථන අංකය : ජංගම ස්ථාවර
(vi) විද්‍යුත් තැපැල්

4. අලියා පිළිබඳ විස්තර

(i) ලියාපදිංචි අංකය සහ දිනය :
(ii) අලියාගේ නම :
(iii) ක්ෂුද්‍ර මෘදුකාංග අංකය :
(iv) දත්ත කාඩ්පත් අංකය : ජංගම ස්ථාවර
(v) දළයේ දිග : වම් දළය : අඩි ............... අඟල්................
දකුණු දළය : අඩි ............... අඟල්................

(vi) උරහිස දක්වා උස : අඩි ............... අඟල්................
(vii) පිරිමි/ගැහැණු බව:
(viii) අලියා රඳවා තබන ස්ථානයේ ලිපිනය :
(ix) වයස (පශුවෛද්‍යවරයාගෙන් ලබාගත් වෛද්‍ය සහතිකයක් ඇමිණිය යුතුය) :
(x) ඉදිරි පාදයේ වට ප්‍රමාණය :
(xi) විශේෂිත ලක්ෂණ :
(xii) මිනුම් ලබාගත් දිනය:
(xiii) ඇත්නම් එකී අලියාගේ මවගේ ලියාපදිංචි අංකය:
(xiv) හඳුනා ගැනීමේ ස්ථිර සලකුණු : (සමේ පැහැය වෙනස්වීම සහ බැඳ තැබීම නිසා පෙර හා පසු පාදවල ඇති වූ කැලැල් යනාදිය ඇතුලුව)
(xv) වෙනත් යම් කැපී පෙනෙන ලක්ෂණ හෝ අංග විකෘතිවීම් :

ඉහත ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි බවටත්, සත්‍ය බවටත් සහතික කරමි.

| ............................ | .................................. | .................................. |
|---|---|---|
| දිනය | අලි හිමියාගේ අත්සන | අලි භාරකරුගේ අත්සන |

ආ. ප්‍රතිකාර සටහන් පත්‍රය

| *අනු. අංකය* | *දිනය* | *රෝගී තත්ත්වය* | *නිර්දේශ කළ ප්‍රතිකාරය සහ ප්‍රතිකාර කළ ආකාරය* | *ප්‍රතිකාර කළ වෛද්‍යවරයාගේ නම සහ අත්සන* |
|---|---|---|---|---|
| | | | | |

ඇ. එන්නත් සටහන් පත්‍රය

| *අනු. අංකය* | *දිනය* | *වයස* | *එන්නත* | *පශු වෛද්‍යවරයාගේ නම* | *පශු වෛද්‍යවරයාගේ අත්සන* | *වෙනත්* |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

## VII වන උපලේඛනය

### ඓතිහාසික සංස්කෘතික පෙරහැරක් සඳහා අලි ලබා ගැනීම සඳහා වන ඉල්ලුම් පත්‍රය

1. ඉල්ලුම්කරුගේ විස්තර:

   (i) ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නමඃ

   (ii) මුලකුරු සමඟ ඉල්ලුම්කරුගේ නමඃ

   (iii) ලිපිනයඃ

   (iv) ජාතික හැඳුනුම්පත් අංකයඃ

   (v) දුරකථන අංකය : ජංගම : ස්ථාවර :

   (vii) විද්‍යුත් තැපැල් ලිපිනයඃ

2. විහාරස්ථානය/දේවාලය පිළිබඳ විස්තර :-

   (i) විහාරස්ථානයේ / දේවාලයේ නමඃ

   (ii) භාරකරුගේ නමඃ

   (iii) ලියාපදිංචි අංකයඃ

   (iv) ලිපිනය :

      (අ) පළාත -

      (ආ) දිස්ත්‍රික්කය -

      (ඇ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය -

      (ඈ) ග්‍රාම නිලධාරී කොට්ඨාසය -

3. විහාරස්ථානය/දේවාලය විසින් වාර්ෂිකව පවත්වනු ලබන පෙරහැර සහ සංස්කෘතික කටයුතු පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක්:-

   (i) ඓතිහාසික සංස්කෘතික පෙරහැරේ නමඃ

   (ii) විස්තරඃ

      (අ) පෙරහැර පැවැත්වෙන ස්ථානයඃ

      (ආ) පෙරහැර ගමන් කරන මාර්ගයඃ

      (ඇ) පෙරහැර පැවැත්වෙන කාලසීමාවඃ

      (ඈ) නියමිත කාලසීමාවඃ

         ආරම්භ වන දිනයඃ වේලාවඃ
         අවසන් වන දිනයඃ වේලාවඃ
         දින ගණනඃ

   (iii) ඉල්ලුම් කරන අලි සංඛ්‍යාවඃ

4. භාරකරු/විහාරස්ථානය/දේවාලය සතුව වෙනත් අලි සිටින්නේ ද? ඔව්/ නැත

   (i) ඔව් නම් අලි සංඛ්‍යාව :

   (ii) එම අලි ලියාපදිංචි අංකය පිළිබඳ විස්තර :

   (iii) ලියාපදිංචි කර නොමැති නම්, එයට හේතු ?

5. අලියා තබාගනු ලබන ස්ථානයේ ලිපිනය සහ එම ස්ථානය අයත් පරිපාලන දිස්ත්‍රික්කය ඃ

6. භාරකරුගේ/විහාරස්ථානයේ/දේවාලයේ ශක්‍යතාව පිළිබඳ විස්තර ඃ

i. අලියා සඳහා වෙන් කරන ලද ඉඩ ප්‍රමාණය ඃ

ii. අලියා තබා ගනු ලබන මඩුවේ විශාලත්වය :

iii. අලියා රැකබලා ගැනීම සඳහා විහාරස්ථානයේ/දේවාලයේ භාරකරු සතු ආර්ථික හැකියාව ඃ
(බැංකු වාර්තා, යම් දේපළ/ඉඩම් ඇතුළු සියලු ආදායම් උත්පාදන වාර්තා පිළිබඳ විස්තර ආසන්නව වසර 3 සඳහා වන අදාළ වාර්තාවල සහතික කළ පිටපත්)

iv. අලියා සඳහා ආහාර ලබා ගන්නා ආකාරය ඃ

v. අලියා සඳහා ජලය (පානය කිරීම සහ නෑම සඳහා) ලබා ගන්නා ආකාරය ඃ

vi. අලියා සඳහා ප්‍රවාහන පහසුකම් ලබා ගන්නා ආකාරය ඃ

vii. මද කිපෙන කාලයේ දී අලියා රඳවා තබා ගන්නා ආකාරය ඃ

viii. අවශ්‍ය ප්‍රතිකාර ලබා ගන්නා ආකාරය ඃ

ix. පශු වෛද්‍යවරයා පිළිබඳ විස්තර (අලියා රැකබලා ගැනීම සඳහා) ඃ
(*අ*) නම ඃ
(*ආ*) ජාතික හැඳුනුම්පත් අංකය ඃ
(*ඇ*) ලිපිනය ඃ
(*ඈ*) සම්බන්ධ කර ගත හැකි විස්තර ඃ ජංගම දුරකතන අංකය - ස්ථාවර දුරකතන අංකය -
විද්‍යුත් තැපැල් ලිපිනය -
(*ඉ*) ලියාපදිංචි අංකය ඃ

7. ඇත්ගොව්වන් පිළිබඳ විස්තර ඃ

i. මුලකුරු සමඟ ඇත්ගොව්වාගේ නම ඃ
ii. ලිපිනය ඃ
iii. ජාතික හැඳුනුම්පත් අංකය ඃ
iv. පළපුරුද්ද ඃ

v. ලබාගෙන ඇති සම්මාන/සහතික ඃ

vii. වෛද්‍ය සහතික ආදිය ඃ

8. ඉහත සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බව ද, අලියකු ලබා ගැනීම සඳහා ම, තෝරාගනු ලැබුවහොත්, අලියාගේ සුභසාධනය සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා ගිවිසුම ප්‍රකාරව අලියා රැකබලා ගැනීමට මා හට හැකියාව ඇති බව ද මම මෙයින් ප්‍රකාශ කරමි.

................................ ..........................................................................,

දිනය. විහාරස්ථානයේ / දේවාලයේ භාරකරුගේ අත්සන.
(නිල මුද්‍රාව)

9. පිටසන් කිරීම/නිර්දේශ කිරීම/ අනුමත කිරීම ඃ

අලියකු රැකබලා ගැනීම සඳහා සහ ඓතිහාසික සංස්කෘතික පෙරහැරක් සඳහා නිදහස් කිරීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිටසන් කරමි/නොකරමි.

.........................................................................................,
හීලෑ අලි ඇතුන් අයිතිකරුවන්ගේ සංවිධානයේ සභාපතිගේ/
ලේකම්වරයාගේ අත්සන.
(නිල මුද්‍රාව)

අලියකු රැකබලා ගැනීම සඳහා සහ ඓතිහාසික සංස්කෘතික පෙරහැරක් සඳහා නිදහස් කිරීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට නිර්දේශ කරමි/නොකරමි.

.................................................................................................,
බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ
කොමසාරිස් ජනරාල්වරයාගේ/බෞද්ධ කටයුතු කොමසාරිස්
ජනරාල්වරයාගේ අත්සන.
(නිල මුද්‍රාව)

අලියකු රැකබලා ගැනීම සඳහා සහ ඓතිහාසික සංස්කෘතික පෙරහැරක් සඳහා නිදහස් කිරීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට අනුමත කරමි/නොකරමි.

.................................................................................................,
බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ
ලේකම්වරයාගේ/බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයාගේ
අත්සන.
(නිල මුද්‍රාව)

අලියකු රැකබලා ගැනීම සඳහා සහ ඓතිහාසික පෙරහැරක් සඳහා නිදහස් කිරීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට නිර්දේශ කරමි/නොකරමි.

.................................................................................................,
වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශයේ විෂය භාර නිලධරයාගේ/
ලේකම්වරයාගේ අත්සන.
(නිල මුද්‍රාව)

ඓතිහාසික සංස්කෘතික පෙරහැරක් සඳහා අලියකු නිදහස් කරමි/නොකරමි.

.................................................................................................,
අධ්‍යක්ෂ ජනරාල්,
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව/ජාතික සත්වෝද්‍යාන
දෙපාර්තමේන්තුව.
(නිල මුද්‍රාව)

9-49

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.